# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

## සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යාංශය

### සුදුසුකම්ලත් වෘත්තිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ



## තනතුර
## නියෝජ්‍ය අධ්‍යක්ෂක ජෙනරාල් (අනධ්‍යයන)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර (අනධ්‍යයන) SLITHM හි කොළඹ සහ සියලුම පළාත්වල පාසල්වල පරිපාලනය සහ මුදල් ආශ්‍රිත කටයුතු සඳහා වගකීමට බැඳී සිටී. SLITHM හි සියලුම පරිපාලනය ආශ්‍රිත කටයුතුවල පරමාර්ථ හා අරමුණු ක්‍රියාත්මක කිරීමේදී SLITHM හි අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරි සහ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය.

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය කළමනාකරණය/පරිපාලනය/ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධිය

**සමග**

ව්‍යාපාර කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය/මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම (විද්‍යාපති)

**හෝ**

තනතුරේ විෂයපථයට අදාළව පිළිගත් වෘත්තීය වරලත් වෘත්තීය ආයතනයක සහය සාමාජිකත්වය

**සහ**

රාජ්‍ය, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල /ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකාරිත්ව මට්ටමේ තනතුරක වසර 18 ක අවම පළපුරුද්ද.

**වයස**

වයස අවුරුදු 35ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින්ට ඉහළ වයස් සීමාව අදාළ නැත.

**වැටුප**

වැටුප් පරිමාණය HM 1-3 වර්ගය - රු. (86,865 - 15x 2,270-120,915)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2016 අනුව මූලික වැටුප් පියවර රු. 86,865/-+ ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ. ඊට අමතරව, රු. 50,000/-ක වාහන දීමනාව හා ඉන්ධන ලීටර් 120 සහ රු.3,000/-ක වෘත්තීය දීමනාව මාසිකව ගෙවනු ලැබේ.

## තනතුර
## අධ්‍යක්ෂක ජෙනරාල් (CEO)

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව/කළමනාකරණ විද්‍යාව/ව්‍යාපාර පරිපාලනය/සංචාරක සහ සත්කාර කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධිය සහ ව්‍යාපාර පරිපාලනය/ සංචාරක සහ සත්කාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති මට්ටමේ පශ්චාත් උපාධිය

**සහ**

කළමනාකරණ මට්ටමේ වසර 20ක අවම පළපුරුද්ද හා ඉන් වසර 5ක් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථා/මණ්ඩල හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක සහතික කළ වාර්තා සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද තිබිය යුතුය

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව/කළමනාකරණ විද්‍යාව/ව්‍යාපාර පරිපාලනය/සංචාරක සහ සත්කාර කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධිය සහ විද්‍යාව/ව්‍යාපාර පරිපාලනය/සංචාරක සහ සත්කාර කළමනාකරණය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක් පිළිබඳ පීඑච්ඩී උපාධිය

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථා/මණ්ඩල හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක සහතික කළ වාර්තා සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 5ක අවම පළපුරුද්ද තිබිය යුතුය

**හෝ**

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමාව, ඉදිරි කාර්යාල මෙහෙයුම්, හෝටල් ගෘහ පාලනය, ආහාර පාන කළමනාකරණය යන ක්ෂේත්‍රයන්ට අදාළව ලබාගත් පූර්ණ උපාධිධාරීත්වය සහ සංචාරක හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ ඒ විෂයයටම අදාළ ආචාර්යය උපාධිය සමග රාජ්‍ය, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල/ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අවම වශයෙන් අවුරුදු 10ක පළපුරුද්ද.

**වැටුප**

වැටුප් පරිමාණය HM 2-2 වර්ගය - රු. (93,020 - 12x2,700-125,420)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2016 අනුව මූලික වැටුප් පියවර රු. 93,020/-+ ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ. ඊට අමතරව, රු. 50,000/-ක වාහන දීමනාව හා ඉන්ධන ලීටර් 150 සහ රු.3,000/-ක වෘත්තීය දීමනාව මාසිකව ගෙවනු ලැබේ.

**වයස**

වයස අවුරුදු 35ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින්ට ඉහළ වයස් සීමාව අදාළ නැත.

**පත්කිරීමේ ක්‍රමය**

2005 අංක 38 දරන සංචාරක පනතේ 36 (1) (අ) වගන්තිය පරිදි

සංචාරක හා ආගන්තුක සත්කාරක සේවා කර්මාන්තය සඳහා මානව සම්පත් සංවර්ධනය උදෙසා අධ්‍යාපනය සහ පුහුණුව ලබාදෙන රටේ ප්‍රමුඛතම ආයතනයයි.

- **සාමාන්‍ය තොරතුරු:**
  - රාජ්‍ය සහ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ දැනට සිටින සේවකයින් තම අයදුම්පත් ආයතනයේ ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය.
  - EPF & ETF සඳහා දායකත්වය:

    අර්ථසාධක අරමුදල - සේවකයා මාසික වේතනයෙන් 10% ක්ද සේවයා 15% ක්ද අරමුදලට බැර කරනු ලැබේ.
    සේවක භාරකාර අරමුදල - සේවයා විසින් 3% ක ප්‍රමාණයක් අරමුදලට බැර කරනු ලැබේ.

- **වෙනත් ප්‍රතිලාභ:**

  සේවකයාට සහ ඔහුගේ / ඇයගේ පවුලේ සාමාජිකයින්ට ආකර්ෂණීය සෞඛ්‍යාරක්ෂණාවරණයකට හිමිකම් ලබනු ඇත.

**ඉල්ලුම් කරන තනතුර කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන්කොට ඉල්ලුම්පත සමග අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව සහතික පත්වල සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ඇතුළුව ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහිතව සකස් කළ අයදුම්පත 2020 පෙබරවාරි 17 වැනි දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න.**


ලිපිනය:

සභාපති

**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය,**

**අංක 78, ගාලු පාර, කොළඹ 03.**

විමසීම්:

0112 208 360

Web Site : www.slithm.edu.lk



Source: Silumina, Sunday Observer (2020.02.02)